# ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ වැඩසටහන් ඇතුළත් හඬ පටි 215ක් පිළිබඳ නාමාවලිය

එච්. සුභාෂිනී අභයදාස ද සිල්වා


## සාරාංශය

1925 දෙසැම්බර් 16 වන දින නිල වශයෙන් ශ්‍රී ලංකා ගුවන් විදුලි ප්‍රචාරක කටයුතු ආරම්භ වූ දිනය ලෙස හැඳින්වේ. එය බ්‍රිතාන්‍ය යටත් විජිත රටක් වශයෙන් දකුණු ආසියාවේ ප්‍රථමයෙන් බිහිවුණු ගුවන් විදුලිය ලෙස ඉතිහාස ගත විය. එතැන් සිට ලංකා ගුවන් විදුලිය මගින් විවිධ වැඩසටහන් සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ත්‍රයෙන්ම ප්‍රචාරය විය. 1936 දී ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ තැටිගත කිරීම් ආරම්භ කරනු ලැබූවත් වර්තමානයේ දක්නට ලැබෙන පටිගත කිරීම ප්‍රථමයෙන් හමුවන්නේ 1948 වර්ෂයෙන් පසුවය.

නාමාවලියක් යනු මුද්‍රිත හෝ මුද්‍රිත නොවන මාධ්‍යයන්ගෙන් බිහිවුණු යම් කෘතියක ග්‍රන්ථ නාමය, කර්තෘ, සංස්කාරකවරු, ප්‍රකාශක, ප්‍රකාශක ස්ථානය, වර්ෂය, එම කෘතියේ භෞතික විස්තරය, මිල, ආදී වශයෙන් වූ ග්‍රන්ථ විඥාපන තොරතුරු ඇතුළත් අකාරාදී පිළිවෙළට සැකසූ ග්‍රන්ථ ලැයිස්තුවකි. මෙම නාමාවලියට ඇතුළත් කර ඇත්තේ 1948 පසු පටිගත කරන ලද වැඩසටහන් ඇතුළත් අහඹු ලෙස තෝරා ගන්නා ලද පටි 215ක විස්තරය. අහඹු ලෙස වුවත් ගුවන් විදුලි සංස්ථාවේ සංරක්ෂණ පුස්තකාලයෙන් එම පටි තෝරාගනු ලබද්දී වැඩසටහන් අන්තර්ගතය සැලකිල්ලට භාජනය කරනු ලැබුණි. ඒ අනුව මෙම නාමාවලිය සඳහා තෝරා ගනු ලැබූ වැඩසටහන් විවිධ, මාතෘකා ඔස්සේ කරන ලද ඒවා වන

අතර එය සමස්ත ගුවන් විදුලියේම වැඩසටහන්වල පිළිබිඹුවක් ලෙස දැක්විය හැකිය.

මෙම නාමාවලිය සම්පාදනය කිරීම සඳහා අවශ්‍ය දත්ත එකතු කිරීමේදී, ප්‍රථමයෙන් මෙහි ඇතුළත් සියලුම පටි ශ්‍රවණය කරනු ලැබුණි. ඊට අමතරව වැඩසටහන් පත්‍රිකාවේ (Cuesheet) සඳහන් තොරතුරු ද උපකාරී විය. සංලේඛ සකස් කිරීමේදී AACR – 2 සහ විෂය වර්ගීකරණයේ දී ඩිවි දශම වර්ගීකරණයේ 21 වන සංස්කරණය අනුගමනය කරනු ලැබුණි. මෙතෙක් ගුවන් විදුලි සංස්ථාව සතුව මෙබඳු නාමාවලියක් නොමැති අඩුව මදක් හෝ අඩු මෙම සජීවී හඬ පටිවල ඇති අලිඛිත සාහිත්‍ය සුළුවෙන් හෝ ලිඛිතව සටහන් කර තැබීමටත්, තවමත් සකස්වී නොමැති අනාගතයේ නිර්මාණය වේ යැයි සිතන ගුවන් විදුලි සංස්ථාවේ හඬ පටි සංරක්ෂණ ප්‍රතිපත්තියට යම් රුකුලක් ලබා දීමේ අරමුණෙනුත්, සියලුම නිවේදකවරුන්, වැඩසටහන් නිෂ්පාදකවරුන් හා පර්යේෂකයන්ට අවශ්‍ය තොරතුරු මූලාශ්‍රයක් ලෙසත් මෙම නාමාවලිය සකස් කැරිණි.

***ප්‍රමුඛ පද*** - නාමාවලි, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, හඬ පටි, සංලේඛ, වැඩසටහන්

## ***හැඳින්වීම***

තන්තු රහිත සංඥා ගමන් කරවිය හැකි " වයර්ලස් ටෙලිග්‍රාෆ් " නම් ක්‍රමය සොයා ගැනීමේ නිල හිමිකරුවා වෙමින් ලෝකයට ගුවන් විදුලිය නම් වූ ඒ සුවිශේෂී යන්ත්‍රය හඳුන්වා දෙමින් 1896 ජූනි 02 දින ගුග්ලියෙල්මෝ මාර්කෝනි ඉතිහාසගත විය. පසුව ඓතිහාසික මූලාශ්‍ර අනුව ප්‍රථම වාණිජ ගුවන් විදුලි විකාශන මධ්‍යස්ථානය කැලිෆෝනියාවේ ශාන්ත ජෝස් හි දී 1909 පිහිටුවිය. 1914 පළමු

ලෝක සංග්‍රාමයේ ආරම්භයත් සමග අක්‍රමවත් වූ නමුත් ගුවන් විදුලි ප්‍රචාරය ව්‍යාප්ත විය. ඒ අනුව "නෙලී මෙල්බා" ගායිකාවගේ ගායනයක් 1920 ජූනි 15 දින යුරෝපයේ විසුරුවා හරිනු ලැබීය. මෙලෙස යුරෝපය පුරා ගුවන් විදුලිය ව්‍යාප්ත වී ආසියාව දක්වා පැමිණියේය.

20 වන ශත වර්ෂයේ මුල් භාගය ගුවන් විදුලිය පිළිබඳ පර්යේෂණාත්මක අවස්ථාවක පසු වුවත් 1922 වන විට ආසියාතික රටක් ලෙස ලංකාව තුළ ද ඒ උණුසුම පැතිරුණි. ශ්‍රී ලංකාවේ ගුවන් විදුලියේ පියා වූ "එඩ්වඩ් හාපර්" (Edward Harper) මහතාගේ මැදිහත්වීම තුළින් 1924 සිට අවස්ථා කීපයක කළ අත්හදා බැලීම්වල ප්‍රතිඵලයක් ලෙස , ආසියාවේ මුල්ම ගුවන් විදුලි මධ්‍යස්ථානය ශ්‍රී ලංකාවේ ආරම්භ විය. ඒ අනුව 1925 දෙසැම්බර් 16 දින නිල වශයෙන් ශ්‍රී ලංකා ගුවන් විදුලියේ ප්‍රචාරක කටයුතු ඇරඹිණ. එය බ්‍රිතාන්‍ය යටත් විජිත රටක් වශයෙන් දකුණු ආසියාවේ ප්‍රථමයෙන් බිහිවුන ගුවන් විදුලිය ලෙස ඉතිහාසගත විය.

මුල් කාලයේ බටහිර සංගීතය, කාලගුණ වාර්තාව, මහාමාර්ග තොරතුරු, වෙළඳ කොටස් මිල ආදිය ප්‍රචාරය විය. බටහිර ගීත ප්‍රචාරය වූයේ බ්‍රිතාන්‍ය ගුවන් විදුලි ආයතනයෙන් ගෙන්වන ලද තැටිවලිනි. මෙම මුල් අවධියේ ප්‍රමුඛස්ථානය හිමි වූයේ ඉංග්‍රීසි භාෂාවට ය. එහෙත් ශ්‍රාවක පිරිස වැඩි වෙන විට ඉංග්‍රීසි මෙන්ම සිංහල, දෙමළ භාෂාවන්ට ද වැඩි අවධානයක් යොමු විය. ඒ අනුව 1928 වන විට සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ත්‍රයෙන් ම වැඩසටහන් විසුරුවා හරිනු ලැබීය.

1936 දී තැටිගත කිරීම් ආරම්භ කරනු ලැබූවත්,පටිගත කිරීම් ප්‍රථමයෙන් හමුවන්නේ 1948 වර්ෂයෙන් පසුවය. ප්‍රථම තැටිගත කිරීම ලෙස 1936 අගෝස්තු 28 දින රාත්‍රියේ මහනුවර රැජින හෝටලයේ සිට එෆ්.ඒ ප්‍රයිස් මහතා විසින් පෙරහැර පිළිබඳ ශබ්ද විස්තර තැටිගත කළ බව සඳහන් ය. මෙයට පෙර තැටිගත කිරීම් සිදුවූවත් ඒවා චිත්‍රපට සංස්ථාවේ හෝ විශේෂයෙන් ම සිංහල ගීත, ග්‍රැමෆෝන් තැටි සමාගම් මගින් තැටිගත කර ඇත. ගුවන් විදුලියෙන් කළේ ඒවා ප්‍රචාරය කිරීම පමණි. 1936 දී බ්‍රිතාන්‍යයෙන් තැටිගත කිරීම් යන්ත්‍රයක් මිලදී ගෙන ඇත. එමගින් දේශීය සංගීතය සංරක්ෂණය කිරීමේ කටයුතු ඇරඹුණ බවත් පැවසේ. ජන ගීතවලට අමතරව 1946 දී පමණ සිංහල ගීත තැටිගත කර ඇත. 1948 න් පසුව පටිගත කිරීම් ආරම්භවී ඇත. 1950 වන විට නව පටිගත කිරීමේ යන්ත්‍ර ලැබුණ බැවින්, පටිගත කිරීම් තවදුරටත් වර්ධනය විය. සංගීත වැඩසටහන්, විකට වැඩසටහන්, නාට්‍ය, ආගමික වැඩසටහන් ආදී දෑ ද පටිගත කෙරුණි.

මෙලෙස පටිගත කරනු ලැබූ සිංහල වැඩසටහන් 215 ක් ඇතුළත් නාමාවලියක් සම්පාදනය කිරීම මෙමගින් සිදු කොට ඇත. ඒ සඳහා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සංරක්ෂණ පුස්තකාලයෙන් පටි තෝරා ගැනීමේදී වැඩසටහන් අන්තර්ගතය සැළකිල්ලට භාජනය කරනු ලැබුණි. මෙම වැඩසටහන් විවිධ මාතෘකා ඔස්සේ කරන ලද ඒවා වන අතර එය සමස්ත ගුවන් විදුලියේ ම වැඩසටහන්වල පිළිබිඹුවක් ලෙස හැඳින්විය හැකිය.

## අරමුණු

ඉපැරණි වැඩසටහන් ඇතුළත් හඬ පට පිළිබඳ නාමාවලියක් ගුවන් විදුලියට සැකසීම ප්‍රධාන අරමුණ විය. පුස්තකාලයක් සතු ප්‍රධාන විමර්ශන මූලාශ්‍රයක් ලෙස නාමාවලි හැඳින්විය හැකිය. ඒ අනුව ශ්‍රව්‍ය මාධ්‍ය පුස්තකාලයක් ලෙස ගුවන් විදුලි පුස්තකාලයේ ද හඬපටි නාමාවලියක් තිබිය යුතුය. මෙයට අමතරව සෙසු අරමුණු ලෙස ;

- හඬ පටි පිළිබඳ නාමාවලියක තිබූ අඩුපාඩුව මගහරවා ගැනීමට.
- වැඩසටහන් නිෂ්පාදනයේදී පැරණි පටිගත කිරීමක් වර්තමානයේ හෝ අනාගතයේ භාවිතය සඳහා යම් නිෂ්පාදනවරයකුට , නිවේදකයෙකුට හෝ අවශ්‍යවේ නම් ඔවුනට අවශ්‍ය එම වැඩසටහන රැගත් පටිය නිවැරදිව කාර්යක්ෂමව සොයා ගැනීමට පහසුකම ලබා දීමට.
- විවිධ අවශ්‍යතාවන් සඳහා හඬ පටි පිළිබඳ තොරතුරු සොයමින් ගුවන් විදුලියට පැමිණෙන බාහිර පර්යේෂකයන්ට , පාසැල් හා විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ට ඔවුන්ගේ අවශ්‍යතා පහසුවෙන් විධිමත්ව , කාර්යක්ෂමව , නිවැරදිව සපුරා ගැනීමට ඉඩකඩ සැලසීම.
- වර්තමානයේ ආරම්භ කර ඇති ඩිජිටල් තාක්ෂණ වැඩ පිළිවෙළෙහි දී සංරක්ෂණය කළ යුතු පටි මොනවාද

යන්න හඳුනා ගැනීමට සහ හඬ පටි ඩිජිටල් තාක්‍ෂණයට පරිවර්තනය කළ පසු ඒ පිළිබඳ අදාළ දත්ත පද්ධති නිර්මාණය කිරීමේ දී නිවැරදි තොරතුරු ලබා ගැනීමට.

- තවමත් සකස්වී නොමැති අනාගතයේ නිර්මාණය වේ යැයි සිතන ගුවන් විදුලි සංස්ථාවේ හඬ පටි සංරක්‍ෂණ ප්‍රතිපත්තියට යම් රුකුලක් ලබා දීමට .

## *අධ්‍යයනයේ වැදගත්කම*

ශ්‍රව්‍ය පුස්තකාලයක් සතුව තිබිය යුතු අත්‍යවශ්‍යම මූලාශ්‍රයක් ලෙස මෙම නාමාවලිය ඉතා වැදගත් වේ. 1925 වසරේ ආරම්භ වූ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ තැටිගත හෝ පටිගත කරන ලද දෑ පිළිබඳව ක්‍රමානුකූල නාමාවලියක් මෙතෙක් නිර්මාණයවී නොමැත. 1947 දී එවකට වැඩසටහන් සැලසුම් කිරීමේ ලේකම් සී.පී.එල්. ගුණවර්ධන මහතා විසින් ක්‍රමානුකූල නාමාවලියක් පිළියෙල කිරීම ආරම්භ කර තිබූ බව ගුවන් විදුලි වංශ කථාවේ සඳහන් වුවත් එවැන්නක් වර්තමානයේ දක්නට නොමැත. ඊට අමතරව 1983 වසරේ එළි දැක්වුණු පියදාස රණසිංහ මහතා විසින් රචිත " අමරදේව ප්‍රතිසංවේදය " නැමැති අමරදේව ගීත නාමාවලිය ද 1987 දී ලීවර් සහෝදර සමාගමේ සංස්කෘතික අරමුදල මගින් ආරම්භ කළ ජන ගී ලේඛන ගත කිරීමේ ව්‍යාපෘතිය යටතේ ඝග දᵒග කුලතිලක මහතා සංස්කරණය කොට සම්පාදනය කරන ලද" ශ්‍රී ලංකා ජන ගී සහ ජන සංගීත කෘති පිළිබඳ නියමු ග්‍රන්ථය " ද හැර හඬ පටි පිළිබඳ නාමාවලි හමු නොවේ.

මෙම හඬපටිවල ඇති අලිඛිත සාහිත්‍යය නාමාවලියක ස්වරූපයෙන් හෝ ලිඛිතව සඳහන් කොට තැබීමෙන් මතු පරම්පරාව දැනුවත් කිරීමට හැකිවීම ඉතා වැදගත් වේ. නාමාවලියේ හඬපටි විස්තර කිරීමේ දී ඒ සෑම හඬ පටියක් සඳහාම අන්තර්ගතය පිළිබඳව කෙටි විස්තරයක් ලේඛනගත කර තිබීම නිසා ඒ අලිඛිත සාහිත්‍යය යම්තාක් දුරට හෝ ලිඛිතව සටහන් කොට තැබීමට උත්සාහ දැරුවෙමි.

එකම වැඩසටහන කොපමණ පටි සංඛ්‍යාවක තිබේද එම පටි මොනවා ද යන්න හඳුනා ගැනීමටත් මෙමගින් හැකියාව ලැබේ. හඬපටි පිළිබඳ තොරතුරු අවශ්‍ය සියලුම පුද්ගලයන්ට එම තොරතුරු සෙවීමේදී ප්‍රායෝගිකව ලැබෙන පහසුකම ඉතා වැදගත් ය. එසේ නොමැති වූ විට පටියෙන් පටිය ගෙන වැඩසටහන් පත්‍රිකාව කියවා බලා හෝ පටිය ශ්‍රවණය සඳහා කාලය ගත කිරීමට සිදුවේ.

ආයතන මට්ටමින් ගුවන් විදුලි සංස්ථාව සතු ශ්‍රව්‍ය සම්පත් ප්‍රමාණය ගණනය කිරීමටත් එම සම්පත්වල ස්වභාවය පිළිබඳ හරස්කඩක් ලෙසත් මෙය හැඳින්විය හැක. ඒ අනුව කොපමණ පටි ප්‍රමාණයක් තිබේ ද , කාගේ කටහඬවල් ගුවන් විදුලිය සතු ද යන්න පහසුවෙන් දැන ගැනීමට හැකිවීම වැදගත් වේ.

හඬපටි සංරක්ෂණ ප්‍රතිපත්තියක් යම් දවසක නිර්මාණය කිරීමේ දී ප්‍රතිපත්ති නිර්ණායක සැකසීමට අවශ්‍ය තොරතුරු ක්ෂණිකව ලබා ගැනීමටත්, විස්තර පත්‍රිකාවක් (Cuesheet) නොමැති ඇතැම් පටි සඳහා එම පටි ශ්‍රවණය කොට අදාළ විස්තර සපයා ඇති බැවිනුත් මෙය වැදගත් වේ.

***විශ්ලේෂණය***

හාවිත කළ නීතිරීති හා ක්‍රමවේද ;

මෙම නාමාවලිය සැකසීමේ දී සංලේඛ නිර්මාණය සඳහා ක්‍රමවේදය ලෙස AACR-2 නීති සංහිතාව අනුගමනය කරන ලදී.

විෂය වර්ගීකරණයේ දී ඩිවි දශම වර්ගීකරණයේ 21 වන සංස්කරණය අනුගමනය කර ඇත. විෂය අනුක්‍රමණිකාව , කර්තෘ අනුක්‍රමණිකාව හා මාතෘකා අනුක්‍රමණිකාව ග්‍රන්ථ අවසානයේ දක්වා ඇත.

සංලේඛ සැලැස්ම :

1.වැඩසටහන් මාතෘකාව

2.ශිල්පියා (හඬ අයිති පුද්ගලයා)

3.පටිගත කරන ලද ස්ථානය හෝ මැදිරිය

4.පටිගත කරන ලද දිනය/භාෂාව

5.අන්තර්ගතය පිළිබඳ සාරාංශය

6.ගතවන කාලය

7.පටිය භ්‍රමණය වන වේගය

8.පටි අංකය

උදාහරණ :

ප්‍රථම නිදහස් දින කථා

ප්‍රථම නිදහස් දින කථා[1කොටස]/ ඩී.එස්. සේනානායක; ටොරිංටන් චතුරශ්‍රය;

1948.02.04.[ඉංග්‍රීසි භාෂාව]

මෙහි ජාතික ගීය ගායනය, මඟුල් බෙර වාදනය පටිගත කොට ඇත. නිදහස් ගොඩනැගිල්ලට මුල් ගල් තැබීමේ උත්සවය පිළිබඳවද තොරතුරු දක්වේ. ඒ සඳහා ඊ.ඒ.පී.විජේරත්න, සී.සිත්තම්පලම්, එස්.ඩබ්.ආර්.ඩී.බණ්ඩාරනායක යන මහත්වරුන් ද සහභාගීවී ඇති බව සඳහන් වේ.

G 3191 අංක දරන පටියේ ද මෙම ඩී.එස්. සේනානායක මහතා කළ මේ කථාව ඇත. එය පටියට පටිගත කර ඇත්තේ 1965.11.22. දිනයි.

7.5 මි.කැ.වා.

ESG 14480

මෙයට අමතරව යම් පටියක සඳහන්ව තිබේ නම් ප්‍රචාරය වූ සේවය , දිනය , වේලාව , නිෂ්පාදක , කාර්මික සහායක , නිවේදක යන තොරතුරු දක්වා ඇත.

දත්ත රැස් කළ ආකාරය ;

- හඬ පටි පිළිබඳව ඒ ඒ පටියේ බහාලූ විස්තර පත්‍රිකාවේ (Cuesheet) දක්නට ඇති තොරතුරු මගින්.
- එක් එක් පටිය සම්පූර්ණයෙන් ශ්‍රවණය කිරීමෙන්.
- ප්‍රධාන පුස්තකාලයාධිපති , සංරක්ෂණ පුස්තකාලය භාර නිලධාරීන් , පැරණි වැඩසටහන් නිෂ්පාදකවරුන් සහ පැරණි නිවේදකවරුන් වැනි විවිධ පුද්ගලයින්ගෙන් ලබාගත් තොරතුරු ආශ්‍රයෙන්.
- තර්කානුකූල උපකල්පන තුළින්. ( උදාහරණයක් ලෙස යම් වැඩසටහනක් කරනු ලැබූ දිනය පිළිබඳ සඳහනක් නොමැති අවස්ථාවක එම පටිය ශ්‍රවණය කර කථිකයා පවසනු ලබන යම් කරුණක් පදනම් කර ගනිමින් දිනය පිළිබඳ නිගමනය කරනු ලබන අවස්ථාවක් දැක්විය හැකිය.)

මුහුණ දුන් ගැටලු ;

- තෝරා ගනු ලැබූ නියැදියට අයත් ඇතැම් පැරණි පටි මේවන විටත් යහපත් ශ්‍රවණ තත්වයක නොතිබීම.
- එකම අන්තර්ගතය පටි කීපයක තිබීමෙන් කාලය අපතේ යෑම.
- ඇතැම් පටිවල අදාළ විස්තර පත්‍රිකා නොමැතිවීම නිසා තොරතුරු සෙවීමේදී අපහසුතාවන්ට පත්වීම.

භාවිත කළ උපකරණ ;

- පටි ශ්‍රවණය සඳහා Otari වර්ගයේ පටි ධාවන යන්ත්‍ර භාවිත කරන ලදී.

- වැඩසටහන් ඇතුළත් හඬ පටි භාවිතය.

- විස්තර පත්‍රිකාව (Cuesheet)

## *නිගමන සහ යෝජනා*

### නිගමන

- රාජ්‍ය මාධ්‍ය ආයතනය ලෙස ශ්‍රව්‍ය මාධ්‍ය සංරක්ෂණය සඳහා ප්‍රතිපත්තියක් සැකසීමේදී ප්‍රයෝජනයට ගත හැකි නාමාවලියක් ගුවන් විදුලි සංස්ථාව සතු නොවීම .

- මේ වනවිට ආරම්භ කර ඇති හඬ පටි ඩිජිටල් තාක්ෂණයට පරිවර්තනය කිරීමේ කාර්ය භාරය වඩා ක්‍රමවත්ව හා කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා අවශ්‍ය නිවැරදි දත්ත සම්පාදනය කිරීමට මෙම නාමාවලිය තුළින් අවකාශය ලැබේ.

### *යෝජනා*

- වැඩසටහනක් නිෂ්පාදනය කිරීමේ දී ඊට අදාළ තොරතුරු සඳහන් කරනු ලබන විස්තර පත්‍රිකාව (Cuesheet) නිවැරදිව සම්පූර්ණ කිරීමේ වැදගත්කම පිළිබඳව වැඩසටහන් නිෂ්පාදක නිෂ්පාදිකාවන් ආයතනික මට්ටමින් දැනුවත් කිරීම.

- එකම වැඩසටහන රැගත් පටි කීපයක් තිබේ නම් සංරක්ෂණ ප්‍රතිපත්ති සැකසීමේ දී එබඳු පටිවලින් එක් පිටපතක් ලේඛණාරක්ෂක දෙපාර්තමේන්තුවට, ජාතික පුස්තකාලයට හෝ කෞතුකාගාර පුස්තකාලය වැනි රාජ්‍ය ආයතනයකට පරිත්‍යාග කිරීමට කටයුතු සැලසීම.

- ශ්‍රවණය කිරීමට අපහසු ඉතා දුර්වල තත්වයේ ඇති පටි කඩිනමින් හඳුනාගෙන ඒවාට අවශ්‍ය තාක්‍ෂණික ප්‍රතිකර්ම කිරීම.

- හඬ පටි පිළිබඳ සියලු දත්ත පරිගණකගත කිරීම.

## ආශ්‍රිත ග්‍රන්ථ


- අබේසේකර, චිත්‍රානන්ද (1980), කොළඹින් කථා කරයි යන හඬ ඇසුණු දා සිට, තරංගණී, 16
- කරුණානායක, නන්දන (1990), හැටහය වසරක ගුවන් විදුලිය, සර්වෝදය විශ්වලේඛා, කොළඹ.
- කාර්මික විකාශනය (1980), *තරංගණී*, 16
- කුලතිලක, සී.ද එස්. සංස්., ශ්‍රී ලංකා ජන ගී සහ ජන සංගීත කෘති පිළිබඳ නියමුව ග්‍රන්ථයක්,
- ලීවර් සහෝදර සංස්කෘතික සංරක්‍ෂණ මණ්ඩලය, කොළඹ.
- කොළඹගේ, ඩී.එම්. ගුවන් විදුලි වංශය
- දහනායක, හෙන්රි වීරසිංහ සහ සෝමතිලක, මුණිදාස **සංස්.** (1998), නිදහසයි ගුවන් විදුලියයි
- ස්වර්ණ ජයන්ති සමරු කළඹ, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, කොළඹ.
- නානායක්කාර, සේන (1999), ගුවන් විදුලිය සංනිවේදනාත්මක ලිපි සමුච්ඡය, ගොඩගේ, කොළඹ.
- පියසටහන් (1980), තරංගණී, 16